සැකසුම -එම් . ඒ . එස් .එන් මලවිආරච්චි සීවලී මධ්‍ය විද්‍යාලය

**10.** එදිනෙදා දිවියේ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා යෙදුම් මෘදුකාංග භාවිත කරයි.

10.3 ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීමකට සමර්පන මෘදුකාංගයක් භාවිත කරයි.

නිවැරදි පිළිතුර තෝරන්න

1 අයේශ විසින් සකස්කරන ලද විද්‍යුත් සමර්පනයක එක් කදාවක් තුළට තම ඡායාරූපය ඇතුලත් කිරීමට අදහස් කරයි. පරිගණකයේ ගොනු කවරයක් තුළ ඇති ඔහුගේ ඡායාරූපය කදාවට ඇතුලත්කළ යුතු පියවර වනුයේ.

(1) Insert > Clip Art

(2) Insert > Picture

(3) Insert > Drop Cap

(4) Insert > Chart

(5) Insert > Smart Art

2 සති අන්තයේ දී නිමල් විවේක කාලය කළමනාකරණය කරනුයේ පහත පරිදිය.

- පොත් කියවීමට 30% ක කාලයක්
- රූපවාහිනී බැලීමට 5% ක කාලයක්
- ක්‍රීඩා කිරිමට 25% ක කාලයක්
- සංගීතයට සවන්දීමට 40% ක කාලයක්

මෙම විස්තරය නිරූපණයට වඩාත් ම සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක් ද?

(1) රේඛීය ප්‍රස්තාරය (2) තීරු ප්‍රස්තාරය (3) වට ප්‍රස්තාරය
(4) විසිරි ප්‍රස්තාරය (5) ස්ථම්භ ප්‍රස්තාරය

3. PowerPoint කදාවක ඇති තොරතුරු වෙනස් කිරිම, එකතු කිරීම, මකා දැමීම වැනි කාර්ය සඳහා වඩාත් සුදුසු වන්නේ කුමක් ද?

(1) Normal view (2) Slide sorter view (3) Outline view
(4) Slide show view (5) Full screen view

4 PowerPoint මෘදුකාංගය භාවිතයෙන් කරන ඉදිරිපත් කිරීමක කදා දැක්මක් (Slide Show) අතරතුර දි B අක්ෂරය එබීමෙන්,

(1) තිරය සුදු පැහැ වෙයි. (2) තිරය කලු පැහැ වෙයි.
(3) තිරය හිස් වෙයි. (4) ඉදිරිපත් කිරීම අවසන් වෙයි.
(5) අවසාන කදාවට යොමුවෙයි.